රුහුණ විශ්වවිද්‍යාලය

2018/2019 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය

පළමු සමාසිකය - 2019 ඔක්තෝබර්/නොවැම්බර්

**SLS 21523/21623 - නූතන සිංහල පද්‍ය සාහිත්‍යය (සිංහල මාධ්‍යය)**

**පළමු ප්‍රශ්නය ඇතුළුව** ප්‍රශ්න **හතරකට (04)කට** පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

කාලය: පැය 03 යි.

---

01. පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මල් ළැදි තැනට මල් පූජා වේද මලේ
ඇතැම් මලකට පැවරෙන්නෙ
සතුට ගෙනියන්න
අනිකකට වෙනත් ගනුදෙනු තිබෙයි
දුක එක්ක

කිසිවෙකුට නොපෙනෙන්න
පිපි පිපී පඳුරුවල කඳු අතර
එහිම හිස් ඔබාගෙන මියෙන මල්
අඬනවද හිනා වෙනවද
දන්නෙ කවුරුන්ද

කුසුම් ශ්‍රම සේනාව
ලොරි කුසේ කොළඹ එන අතරතුර
එමල් මල් කතා කරනවත් ඇති
ඇතැම් මල් තනිව හිතනවත් ඇති

අනේ මම යම්ද යම් ශෝක් මල් කළඹකට
ශෝක කැකුළක් වෙම්ද සොහොන් මල් වඩමකට

ඒත් මල්කරුවනේ
මල් මූණු දෙස බලා පුළුවනිද
දුක සතුට හඳුනන්න
මිනිස් දිවි මැවුම්කරුවන්ට මෙන්
ඉඩ නැද්ද ඔහෙලටත් වරදින්න

හොරෙහින් හිනැහී බලන

මලක් දෙමලක් තිබෙයි

මළ ගෙයක දෙණ අසල

දකිමි මම හඬා වැටෙනා මලක්

සුබ පැතුම් මල් පැසක

(ලක්ෂාන්ත අතුකෝරලගේ සමහර කමටහන් කාව්‍ය කෘතියෙනි)

02.

අ. කොළඹ කවියේ වැඩිහිටි පරපුරේ කාව්‍ය රචනා බිහිවීමට බලපෑ හේතු සාධක පිළිබඳ විචාරාත්මක පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 07යි)

ආ. කොළඹ කවියේ පළමු තරංගයේ ඇති විශේෂතා උදහරණ කවි මගින් විමසීමකට පෙන්වා දෙන්න. (ලකුණු 08යි)

03.

අ. රෝමාන්තිකවාදය හෙවත් අරුමැසිවාදය (Romanticism) යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර පහත සඳහන් කාව්‍ය නිර්මාණවල එකී ලක්ෂණ අන්තර්ගත වන්නේදැයි විමසා බලන්න. (ලකුණු 07යි)

"දතකට මදිනුවට කෑ දළි අඟුරු තොලේ
වමතට අසුව උකුලේ හුර පුරුදු කළේ
ගෙදරට පහළ ලිඳ වෙත පය නඟන වෙලේ
ඇය නිය පහර වැද පිනිබිඳු බිමට හැලේ"

"නිල් කැටයක් වගේ දිය ඇති නිලට නිලේ
මේ ලිඳ කුඹුක් ගහයට ඇත ඉහළ වෙලේ
හිරු රැස් වැටී එහි කිරිමැටි පතුල දිලේ
දුන් ලිං පඩිය උඩ උකුලේ තිබුණු කළේ"

(සාගර පළන්සූරියගේ 'ඡායා' පද්‍ය පන්තියෙනි)

ආ. "විමලරත්න කුමාරගම යනු රෝමාන්තිකවාදී ලක්ෂණවලින් සිංහල කවිය යථාර්ථවාදයට සමීප කළ කවියාය." මෙම ප්‍රකාශය උදහරණ මගින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04.

අ. නිසඳැස් කවිය බිහිවීමට බලපෑ හේතු සාධක කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 07)

ආ. ජී.බී. සේනානායක නිසඳැස් පද්‍ය ආකෘතිය භාවිත කිරීමේදී දක්වූ ශක්‍යතාව උදහරණ ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු 08)

05.

අ. නිසඳැස් කවියේ ද්විතීය තරංගය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් සපයන්න. (ලකුණු 07යි)

ආ. සමකාලීන සමාජ, දේශපාලන සංසිද්ධීන් උක්ත අවධියෙහි පද්‍ය නිර්මාණවලට විෂය වූ ආකාරය අභිමත කවීන් තිදෙනෙකුගේ (03) නිර්මාණ ඇසුරු කරගනිමින් විස්තර කරන්න. (ලකුණු 08යි)

06.

අ. "කවියක ආකෘතිය එහි ආත්මයෙන් වෙන් කළ නොහැකිය" යන විචාරක මතය ඔබට අභිමත කාව්‍ය නිර්මාණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

ආ. නූතනම කවීන්ගේ (2000 වර්ෂයෙන් පසු) නිර්මාණ කෙරෙන් විද්‍යමාන ආනුභූතික විචිත්‍රත්වය සනිදර්ශනව විභාග කරන්න. (ලකුණු 08යි)

07.

අ. සංකල්ප රූපයක සාර්ථකත්වය කෙරෙහි බලපාන අංග ද්වයක් පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කරන්න. (ලකුණු 07)

ආ. නව්‍ය සංකල්ප රූප පරිසේවනයට සයිබර් අවකාශය ආශ්‍රිත නිර්මාණකරුවන් දක්වන ශක්‍යතාව පිළිබඳ ඔබේ අදහස දක්වන්න. (ලකුණු 08)

සෑම ප්‍රශ්නයක් සඳහාදම ලකුණු 15ක් හිමි වේ. (පළමු ප්‍රශ්න හැර සෑම ප්‍රශ්නයක්ම ලකුණු 07 සහ 08 වශයෙන් කොටස් දෙකකට බෙදේ.)